# කාර්ය පත්‍රිකාව

**1.** පන්තිය : 8 ශ්‍රේණිය විෂය : විද්‍යාව අදාල සතිය : 01 සතිය දෙසැම්බර්

**2.** ඒකකය : 14 **සෞරග්‍රහ මණ්ඩලය ආශ්‍රිත සංසිද්ධි හා ගවේෂණ**

## 3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:

I. විද්‍යාව පෙළ පොතේ 14 පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

II. රාත්‍රී අහස නිරීක්ෂණය කොට තාරකා මණ්ඩල හා ග්‍රහලෝක හඳුනා ගන්න.

III. ප්‍රධාන තාරකා මණ්ඩල වල ප්‍රධාන තරු හඳුනා ගන්න.

IV. අභ්‍යවකාශ ගවේෂණයට අදාළ වැදගත් සිදුවීම් අනුපිළිවෙලින් දැක්වෙන වාට් සටහනක් පිළියෙල කරන්න.

V. සුදුසු ආකෘතියක් භාවිතයට ගනිමින් රොකට්ටුවක් සකස් කරන්න.(වැඩිහිටි ආධාර සහිතව)

VI. සියොල්කොවුස්කි හා ගොඩාඩ් රොකට් පිළබඳ ඉටු කළ මෙහෙය ගැන කරුණු සොයා වාර්තාවක් පිලියෙල කරන්න.

VII. සන්නිවේදනය සඳහා චන්ද්‍රිකා භාවිතා කළ හැකි බවට ආතර් සී ක්ලාක් විසින් කරන ලද පුරෝකථන පිළිබඳ තොරතුරු සොයන්න.

**4.** ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, **websites, LMS** පාඩම් හා වෙනත් ඉගෙනුම් ආධාරක **(online, offline, printed)** :

I. **e -නැණපියස:**

- https://www.enenapiyasa.lk/lms/mod/page/view.php?id=18368

II. **Youtube:**

- https://youtu.be/MxlIktyx-bk

III. **E- තක්සලාව**

- https://www.ethaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=123&lang=si

**5. මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :**

I. සියලු අභ්‍යවකාෂ ගවේෂණ ක්‍රියාකාරකම් මානවයාගේ යහපැවැත්ම අරමුණු කොට සිදු විය යුතු බව පිළිගනී

II. අභව්‍යාකාෂ ගවේෂණය හා කෘත්‍රිම චන්ද්‍රිකා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

III. සන්නිවේදනය සඳහා චන්ද්‍රිකා භාවිතා කළ හැකි බවට ආතර් සී ක්ලාක් විසින් කරන ලද පුරෝකථන පිළිබඳ තොරතුරු සොයයි.

IV. ප්‍රධාන තරු රටා හඳුනා ගැනීමට හා රාශි චක්‍රය හඳුනා ගනී.

**6. ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය** :

**1**.පහත දැක්වෙන තරු/ තරු රටා , ඒවායේ ලක්ෂණ හා ගලපන්න.

| | **අදාල ලක්ෂණ** | **තරු/ තරු රටා** |
|---|---|---|
| 1. | පෘථිවි අක්ෂය එල්ලේ ඇති තරුවකි. | මහ වලසා |
| 2. | රාත්‍රී අහසේ ඇති දීප්තිමත්ම තරුවයි. | වෘශ්චික |
| 3. | ප්‍රසිද්ධ තරු පොකුරකි. | ඕරායන් |
| 4. | දඩයක්කාරයා තරු රටාවට තවත් නමකි. | රෙගියුලස් |
| 5. | සිංහ රාශියේ ඇති දීප්තිමත්ම තරුවයි. | පෝලාරිස් |
| 6. | සප්ත ඍෂි, නගුල යන නම් ඇති තරු රටාව. | සීරියස් |
| 7. | ගෝනුස්සෙකුගේ හැඩැති තරු රටාවයි. | මිථුන |
| 8. | නිවුන් සොහොයුරන් දෙදෙනෙකු නිරූපනය කරන තරු රටාවයි. | හත්දින්න |

2. පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. රාශි චක්‍රය යනු කුමක්ද?
2. රාශි චක්‍රයට අයත් තරු රටා අනුපිළිවෙලින් නම් කරන්න.

3. රාත්‍රී අහසේ තරුවක් හා ග්‍රහලෝකයක් වෙන් කර හඳුනාගත හැකි ලක්ෂණ දෙකක් ලියන්න.

4.තරු රටා ඇසුරින් මිනිසාට ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

5. ආනතිමානය යනු කුමක්ද?

.